

**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳද යන්න සහෘද ඔබත් සමග බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නර-කදැයි නිගමන නොදී, මිනුම් දඬු හා විචාරක්ෂින් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## මොනර කුලයෙන්

**නහයෙන් කටින් වගුරවමින් දුවිල්ල**
**හූ කියමින් දිව එනු දැක පෑවිල්ල**

**කැදලිවල දොර ජනෙල් බිඳගෙන**
**අතට අහුවුණු දෙයක් අරගෙන**
**සංක්‍රමණික පක්ෂි පිරිස**
**ඉගිලී යනමුත් ඈතට**

**කොතෙක් වියළීගිය කලෙක වුව කලාපය**
**ඉපල් වී ගිය තුරු හිස් මතම රැඳෙනු මිස**
**මොනර කුලයෙන් එකෙක් හෝ**
**සංක්‍රමණය නම් නොවෙයි**
**තෙත සපිරි පෙදෙස් වෙත**

**කෙළි බඩු නැතිව ළතැවෙන**
**පොඩි උන් වෙනොත් මිදුලක**
**පහත් වී සැණෙකින් එතැනට**
**පිලක් හෝ දෙකක් හළායන**
**සිරිතක් තියෙයි උන් ළඟ**

## රුවන් බන්දුජීව

('මිළඟ මිවිත' කාව්‍ය සංග්‍රහය - 2013 )

ශුෂ්ක හෝ වියළි කලාපයට ආවේණික පක්ෂියකු වූ මොනරා සංකේත කරගෙන ගොඩනැංවෙන කවියකි මේ. කවිය පටන් ගන්නේ මොනරුන්ගේ වාසභූමි ගැන විත්තරූප මැවෙන ජේළි දෙකක විග්‍රහයක් මගිනි. ශුෂ්ක කලාපයට පෑවිල්ල ගලා එන්නේ දුවිල්ලද කැටුවය. වැසි නොවට වියළි බිම මත දැඩි සූර්ය තාපයේ කැකෑරෙන දූලි සුළඟ ජීවිතය වඩාත් අසීරු කරවයි. නමුදු ජීවිතය කියන්නේම දුෂ්කරතා හමුවේ පළා නොයා ඒවාට මුහුණදීම නොවේද? උරුම වූ වපසරිය තුළ තම සතුට සොයා පාදා ගැනීම නොවේද?

නමුදු අනවරත ගැහැට උවදුරු අතරමැද, එබිම වාසස්ථානය කරගත් සංක්‍රමණික පක්ෂියෝ කැදලි අතහැර යන්නට පටන් ගනිති; තුඩින් ගත් දෙයක් අරගෙන වහ වහා සරුසාර තෙත් බිම් සොයා පියහඹති. උනුනට කාගේවත් බිම්කඩක් වෙනුවෙන් අවියෝජනීයව බැඳුණු සහ-සම්බන්ධතාවක් නැත. උන්ට එය එදාවේල සපයන තවත් එක් නැවතුම්පොළක් පමණි. ඒ උන් උපන් බිම නොවේ. හැදුණු වැඩුණු බිම නොවේ. උන්ගේ චර්යාව වන්නේ, රිසියේ ජීවත්වීමට වටාපිටාව සැකසී ඇත්නම් පමණක් එහි ජීවත්වීමත්, සෘතු විපර්යාසයක් හෝ ස්වා-භාවික ආපදාවක් පෙනෙන මානයේ නම් වහා අලුත් වාසස්ථාන සොයායාමත්ය.

මෙහිදී සංක්‍රමණික පක්ෂියන් ලෙස අඟවන්නේ, තමනට ලාභ ප්‍රයෝජන ලැබෙන වේලාවට කවුරුන් හෝ කෙරේ ළංවී, ඒවා හිත වනකොට, රහසේම ඈත්වන ගුණමකු මිනිසුන් පිරිසක් පිළිබඳ නොවේද? මිතුරු වෙසින් කිට්ටුවී, කාසි වාසි මැද විහිළු සපයමින් සිනාවෙන් කල්මරන ඔවුහු අනෙකාගෙන් ප්‍රයෝජනයක් නැතිවිට හෝ ඊටත් වඩා වාසි ලැබිය හැකි වෙනත් කෙනෙකුන් හමුවූ විට පැදුරටත් නොකියා පළායති.

පෑවිල්ල එන්න එන්නම වැඩිවේ. තුරු හිස් ඉපල් වී යයි. වැහි කඳුළක් එන සේයාවක් වත් අහස් කුස තැවරී නැත. පොළව ඉරිතලා යයි. දූලි කුණාටු වැදුණු තුරු පත් දුඹුරු පෑ ගැන්වී ඇත. නමුත් එවැනි දුෂ්කරතා හමුවේ පාට සිහින වලින් සපිරි හිල්වන් තෙත බිමක් සොයා නොයන පිරිසක්ද වේ. ඒ කර්ණ කටුක පෑවිල්ල ඉවසා දරාගෙන හිඳින මොනර කුලයයි. උන් එබිම ආවේණික පක්ෂිහු වෙති. තම භූමිය හා බැඳුණු, ඒ හා අනන්‍ය වුණු ජීවන රටාව තුළ මෙය තවත් එක් ගැහැට පිරි කාල පරිච්ඡේදයක් විනා, පළා යායුතු මොහොතක් නොවේ. මොනරුන් ආඩම්බරය. ඒ ආ-ඩම්බරයම, තම නිපබිම් කෙරේත් උන්හට ඇත. දුර ඈත තෙත් බිම් සොයා නොගොස් පඬු පෑ දූලි වළා මැද නිල තවරමින් රඟන මොනරුන්ට පරිසරයේ කර්කෂ බව නොදැනෙන බවක් මින් නොකියැවේ. මිනි-සුන්ට යස-අයස කාලයන් ජීවිතයේදී හමුවේ. ඒවාට මුහුණ දීමට සවිශක්තිය තිබිය යුතුය. අත්තෙන් අත්තට පනිමින්, වාසි පැත්තට හෝයියා නොකියමින් තම තම නැණ පමණ, සවි පමණ ඒවාට මුහුණ දෙන්නේ සැබෑ මිනිසුන් නොවේද? කටකයා මොනරා තුළින් සංකේතවත් කරන්නේ එවන් ස්වාභිමානී මිනිසකු නොවේද?

එලෙස ශේෂ වුණු මොනරුන් වියළි කලාපයේ අතු-ඉති මත ළඟ සිටින විට උන්ට පෙනෙන්නේ, ඒ දුෂ්කර පරිසරයේම කොටසක් බඳු දරිද්‍රතාවෙන් පෙළෙන මිනි-සුන්ය. වැලි කෙළින, දූලි නාන දරුවන්ය. ඒ හැමෝම අසරණය. නමුත් ඒ උන්ගේ ජීවිතයයි. සංක්‍රමණික කුරුල්ලන් මෙන් හිතෙන හිතෙන වෙලාවට තෙත් බිම් වලට මාරු විය නොහැක. පරිසරයේ රළු පරළු බව තුළින් මිනිස් සංහතියේ ජීවන දුෂ්කරතාව සංකේතවත් කරන කවියා, ඒ අබිති පැටවුන් කෙළි සෙල්ලම් පවත්වන ළමා ලෝකය කෙබඳු එකක්දැයි ව්‍යංගයෙන් කියයි. සුඛෝපබෝගී කෙළි සෙල්ලම් බඩුවලින් තොර දිළිඳු ළමා ලෝකයකි ඒ. උන්ගේ ලෝකය විචිත්‍ර කරන්නේ කුරුම්බැට්ටි, වැලි පොල්කටු වැනි ස්වා-භාවික සම්පත් පමණි. ඉතින් මේ දරුවන්ගේ අතිංසක සතුට වෙනුවෙන් පිලක් දෙකක් හළායන පුරුද්දක් මොනරුනට ඇති බව කටකයා කියන්නේ අනුන්ගේ දුක වැටහෙන ඒ ආත්මයන්, අවඝිරතා මැද වුවද අන් අයටත් පිහිටක් වන බව අඟවමිනි.

වාසි දැක දැක ඒ ඒ දෙසට පළායන ගුණමකුවනතර තමන්ගේ ස්වාභිමානය රැකගෙන ජීවිතය ජයගන්න වෙහෙසීම කවර නම් වරදක් ද? ශුෂ්ක බිමට ආවේණික, සාඩම්බර මොනරුන් හා එබිම වසන සංක්‍රමණික පක්ෂියන් සංකේතානුසාරයෙන් ගෙනහැර පාමින් අප සමාජයේ ජීවත් වන මිනිස් දෙවගක් ගැන සමාජ හා ජීවිතාවබෝධයක් ඇති කරන මේ කවිය, කටකයාගේ කාව්‍යමය බුහුටිකම මැනවින් විදා පායි.